රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவலகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:(94) 011- 2694560 Telephone
ෆැක්ස් தொலைநகல்:(94) 011- 2692254 Fax
ඊ-මේල් மின்னஞ்சல்:dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: www.pubad.gov.lk Web Site

මගේ අංකය / எனது இல / My No: COM/TRANS/BR/GEN
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.07.11

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ සේවක සංඛ්‍යා තොරතුරු PACIS මෘදුකාංගයේ යාවත්කාලීන කිරීම හා MISCO මෘදුකාංගය මගින් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික නොවන ස්ථාන මාරු ඉල්ලීම් මාර්ගගතව (Online) ලබා ගැනීම</u>**

ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් මාර්ගගතව (Online) ලබා ගැනීමේ වූ ක්‍රියාවලියේදී ඔබ විසින් දැක්වූ සහයෝගය ඉතා අගයන අතර මෙහි ඉදිරි අදියරයන් සාර්ථක කර ගැනීම සඳහාද එම සහයෝගය එලෙසම අපේක්ෂා කරමි.

02. මාර්ගගත (Online) ස්ථාන මාරු ඉල්ලීම් ඉදිරිපත් කිරීම, සේවක සංඛ්‍යා යාවත්කාලීන කිරීම මෙන්ම නිලධාරයන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් සඳහා නිර්දේශ ලබාදීම සඳහා MISCO මෘදුකාංගය භාවිතා කළ යුතු අතර මෘදුකාංගය වෙත පහත පරිදි පිවිසිය හැක.

අ) LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගනු ලබන්නේ නම් http://10.250.1.112/misco/
ආ) වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගනු ලබන්නේ නම් http://43.224.125.68/misco/

MISCO මෘදුකාංගය වෙත පිවිස, එහි අතුරු මුහුණතේ ඇති Help සබැඳිය ඔස්සේ ගොස් පරිශීලක අත්පොත (User Guide) පරිශීලනය කිරීමෙන් මේ සඳහා උපකාර වන තොරතුරු ලබාගත හැක.

03. <u>PACIS මෘදුකාංගය යාවත්කාලීන කිරීම</u>

අ) ඒකාබද්ධ සේවා අංශයේ ඉදිරි සියළු බඳවාගැනීම් සහ පුරප්පාඩු පිරවීම සඳහා PACIS මෘදුකාංගය ඔස්සේ යාවත්කාලීන කරන ලද දත්ත යොදා ගැනීමට අපේක්ෂිත බැවින් සෑම මසකම 01 වන දින හා 15 වන දිනට පවතින සේවක සංඛ්‍යා එම දිනයන්හිදී යාවත්කාලීන කරන මෙන් ඔබ යටතේ පවතින සියළු ආයතනයන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි. තවද ඔබ සියලු දෙනාගේ පහසුව සඳහා PACIS මෘදුකාංගයද, MISCO මෘදුකාංගය තුළම ඇතුලත් කර ඇති බවද කාරුණිකව දැනුම් දෙමි.

ආ) සේවක සංඛ්‍යා යාවත්කාලීන කිරීම සඳහා ඉහත 02 ඡේදයේ සඳහන් සබැඳියන් ඔස්සේ ආයතන පිවිසුම (Institutional Login) තුලින් දත්ත පද්ධතියට ඇතුලත් විය යුතු අතර මෙනුවෙහි (Menu) ඇතුලත් PACIS වෙත යොමු වීමෙන් සේවක සංඛ්‍යා ඇතුලත් කිරීම සිදු කල හැකි වේ. ආයතන සඳහා මේ වන විටත් ලබා දී ඇති මුරපද (Password) මේ සඳහා භාවිත කලයුතු අතර, තම ආයතනයට අදාල මුරපද (Password) මේ වනතෙක් ලබාගෙන නොමැති නම් ddcs4.pubad@gmail.com වෙත ආයතන ප්‍රධානියා විසින් ඊමේල් පණිවිඩයක් යොමු කිරීම මගින් ආයතනයට අදාල මුරපද (Password) ලබා ගත හැක.

ඇ) PACIS හි සේවක සංඛ්‍යා යාවත්කාලීන කිරීමට අමතරව, අදාල දත්ත වල නිරවද්‍යතාවය සනාථ කර ගැනීම සඳහා ඒකාබද්ධ සේවයට අයත් සියළු නිලධාරීන්ට තම විස්තර 2022/08/31 දිනට පෙර MISCO මෘදුකාංගය වෙත ඇතුලත් කිරීම/ යාවත්කාලීන කිරීම සඳහා උපදෙස් ලබා දෙන මෙන් කාරුණිකව දන්වා සිටිමි. ඒකාබද්ධ සේවා නිලධාරීන්ගේ සියළු ආයතනික කටයුතු සඳහා මෙම දත්ත යොදා ගැනීමට යෝජිත බැවින් මෙම කාර්යය අනිවාර්යයෙන් සිදු කල යුතු බවට නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි. තවද දත්ත ඇතුලත් නොකල/ යාවත්කාලීන නොකල නිලධාරීන්ගේ ආයතනික කටයුතුවල ප්‍රමාදයන් ඉදිරියේදී සිදුවිය හැකි බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

04. <u>MISCO මෘදුකාංගය මගින් වාර්ෂික නොවන ස්ථාන මාරු ඉල්ලීම් මාර්ගගතව (Online) ඉදිරිපත් කිරීම</u>

අ) කඩදාසි භාවිතය අවම කිරීම හා සන්නිවේදනය පහසු කිරීමේ පියවරක් ලෙස ස්ථානමාරු ඉල්ලීම් මාර්ගගතව ගෙන්වා ගැනීම යෝග්‍ය වන බැවින් නියමු ව්‍යාපෘතියක් ලෙස කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන් සඳහා වාර්ෂික නොවන ස්ථාන මාරු ඉල්ලීම් මාර්ගගතව (Online) ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ඇත. නමුත් මාර්ගගත ක්‍රමයට ස්ථාන මාරු අයදුම් කිරීම තුලින් එම නිලධාරීන් සියළු දෙනාට ස්ථාන මාරු ලබා දීමක් සිදු නොවන බව කාරුණිකව දැනුම් දෙන අතර සාමාන්‍ය ස්ථාන මාරු ලබා දීමේදී මෙතෙක් අනුගමනය කල ප්‍රතිපත්තිමය තීරණ මේ සඳහාද වලංගු වන බව කාරුණිකව දන්වමි.

ආ) ආයතන ප්‍රධානියා විසින් මෙම ස්ථාන මාරු වීම් සඳහා මාර්ගගත ක්‍රමයට නිර්දේශ ලබා දිය යුතු අතර, සේවා සහ අනුප්‍රාප්තික අවශ්‍යතාවයන් මෙන්ම පුරප්පාඩු පැවතීම යන සාධක මත ස්ථාන මාරු ලබා දීම සිදු වන බව නිලධාරීන් දැනුවත් කරන මෙන් වැඩිදුරටත් දන්වමි. මාර්ගගතව ඉල්ලීම් ඉදිරිපත් කිරීම අපහසු අවස්ථාවන්හිදී ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 02/2015 මගින් හඳුන්වාදී ඇති CST/01 ආකෘතිය මගින් [A4 කඩදාසියේ දෙපස (Both Sides) මුද්‍රිත] ස්ථාන මාරු ඉල්ලීම් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

ඇ) මාර්ගගතව (Online) ඉදිරිපත් කර ඇති වාර්ෂික නොවන ස්ථාන මාරු ඉල්ලීම් සඳහා ආයතන ප්‍රධානීන් විසින් තම නිර්දේශය මාර්ගගතව ලබාදීමේදී, ඒ සඳහා MISCO මෘදුකාංගයේ මෙනුවෙහි ඇති TRANSFER ⟶ ENTRY ⟶ RECOMMENDATION (T) සබැඳිය ඔස්සේ නිර්දේශ ලබාදිය යුතු බවද, මුල් පිටුවෙහි (Home Page) දක්වා ඇති Step 01 (Transfer) හි SPECIAL TRANSFER LIST 01 ක්ලික් (CLICK) කර එහි to page සබැඳිය ඔස්සේ ස්ථාන මාරු නියෝගද MISCO මෘදුකාංගය ඔස්සේම ලබා ගත හැකි බවද වැඩිදුරටත් දන්වමි. (වැඩිදුර විස්තර සඳහා ඇමුණුම 01 බලන්න)

ඈ) වාර්ෂික නොවන ස්ථාන මාරු ඉල්ලීම් මාර්ගගතව (Online) ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යම් ගැටළුවක් පවතී නම් msotransfer.pubad@gmail.com ඊ තැපැල් ලිපිනය ඔස්සේ තම ගැටළුව ඉදිරිපත් කළ හැකි බව ඔබ ආයතනයන්හි සේවය කරන කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන් දැනුවත් කරන මෙන්ද ඉල්ලමි.

05. ඔබ ආයතනයන්හි සේවය කරන ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන්ගේ ආයතනික කටයුතු වඩා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා වූ මෙම ප්‍රයත්නය සාර්ථක කරගැනීම සඳහා ඔබගේ සහයෝගය තවදුරටත් අපේක්ෂා කරමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

## 01. ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබා දීම

MISCO මෘදුකාංගයේ මෙනුවෙහි ඇති TRANSFER ⟶ ENTRY ⟶ RECOMMENDATION (T) සබැඳිය ඔස්සේ නිර්දේශ ලබාදිය යුතු වේ.




ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබා දීම සඳහා අදාල නිලධරයාගේ නම තෝරා ඉදිරියෙන් ඇති Select යන්න තෝරා ගන්න.එහි ඇති Officer Recommendation හි ඇති ලැයිස්තුවෙන් අදාල පරිදි නිර්දේශය තෝරා ගන්න.




එහි දක්වා ඇති Reason හි ඇති ලැයිස්තුවේ අදාල කරුණ තෝරා Remarks හි වෙනත් සටහන් කල යුතු යමක් ඇත්නම් ඇතුලත් කර Add Decision Button Click කරන්න.

elcome Department Head's recommendation to transfer request

Selected Employee: Abeyweera | Officer Recommendation : Not Recommend | Reason: --Select-- (--Select--, --Select--, Service Requirment, Lack of service Period, Transer Issued on Request) | Remarks: NO | Add Dicision

View Application

List to be Confirm

Show 10 entries | Search:

| | NIC | NAME | SERVICE | DATE | TYPE | RECOMMON | REASON | SN | RECOMMN_HD | REASON_HD | | WORKPLACE |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Select | 197311200811 | Abeyweera | Office Employee Service | 9/1/2021 12:00:00 AM | ANNUAL | | | 197311200811ANL20221 | | | N0091429 | Matara Senior Supdt Police Office of - DPS |
| Select | 197931203280 | DE SILVA | Managment Service Officers | 9/1/2021 12:00:00 AM | ANNUAL | | | 197931203280ANL20221 | | | N0091429 | Matara Senior Supdt Police Office of - DPS |
| Select | 198204103270 | Chinthaka | Office Employee Service | 9/17/2021 12:00:00 AM | ANNUAL | | | 198204103270ANL20221 | | | N001886 | Department of Criminal Investigation - DPS |
| Select | 198215001490 | Pushpakumara | Office Employee Service | 8/28/2021 12:00:00 AM | ANNUAL | | | 198215001490ANL20221 | | | N0090270 | Bandarawela Senior Supdt Police Office of - DPS |
| Select | 198300100033 | GANES | Managment Service Officers | 7/17/2021 12:00:00 AM | NORMAL | | | 198300100033NML20212 | | | N0091833 | Police Kennel Division (Asgiriya) - DPS |
| Select | 198305700535 | Kumara | Office Employee Service | 9/21/2021 12:00:00 AM | ANNUAL | | | 198305700535ANL20221 | | | N001886 | Department of Criminal Investigation - DPS |
| Select | 199328503493 | RAFIUDEEN | Managment Service Officers | 8/10/2021 12:00:00 AM | ANNUAL | | | 199328503493ANL20221 | | | N000215 | Sri Lanka Police - DP |
| Select | 199486200855 | KAUSHALYA | Managment Service Officers | 8/30/2021 12:00:00 AM | ANNUAL | | | 199486200855ANL20221 | | | N0091833 | Police Kennel Division (Asgiriya) - DPS |
| Select | 622210053v | WIMALASIRI | Managment Service Officers | 7/27/2021 12:00:00 AM | MUTUAL | | | 622210053vMTL20211 | | | N0091184 | Kuliyapitiya Senior Supdt Police Office of - DPS |
| Select | 627940890V | M P Wahalatantrie | Managment Service Officers | 9/9/2021 12:00:00 AM | ANNUAL | | | 627940890VANL20221 | | | N0091834 | Police Medical Service Division - DPS |

## 02. ස්ථාන මාරු නියෝග ලබා ගැනීම

තම ආයතනය තුල සේවය කරන නිලධාරීන් හට ස්ථාන මාරු වීම් ලබා දී ඇත්නම් එය මුල් පිටුවේ Step 01 (Transfer) හි SPECIAL TRANSFER LIST 01 ක්ලික් (CLICK) කර එහි to page සබැඳිය තුළින් ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධරයන්ගේ ලේඛනය වෙත පිවිස අදාළ ස්ථාන මාරු නියෝග ලබාගත හැකිය.

| DESCRIPTION | VALUE | PAGE | |
|---|---|---|---|
| STEP01 -> GRAGUATES APPOINTMENT LIST - 2022 | | HrmInst_ReqGraguateList_7.aspx | To Page |
| STEP02 -> DUTY ASSUME GRAGUATES APPOINTMENT LIST - 2022 | | HrmInst_DutyAssumeN7.aspx | To Page |
| STEP03 -> ATTACHMENT (Graguaate Appointment / Transer officers) | | HrmInst_Attachment.aspx | To Page |
| STEP04 -> ARRIVAL (for Attached persons at Sub Office) | | HrmInst_Attachment02.aspx | To Page |
| INSTITUTE SUMMERY | | HrmInst_GradgSummRpt01.aspx | To Page |
| PLACE AMENDMENT LIST (By special requiment) | | HrmInst_ReqGRAmmendList_7.aspx | To Page |
| STEP01 (Transer) -> SPECIAL TRANSFER LIST 01 (With Transer Order) | | HrmInst_TransReportI.aspx | To Page |
| STEP02 (Transer) ->RELESE FROM INSTITUTE (TRANSFER) | | HrmInst_TrnsReleasment.aspx | To Page |
| STEP03 (Transer) -> DUTY ASSUME | | HrmInst_DutyAssume.aspx | To Page |
| STEP04 (Transer) ->SPECIAL TRANSFER LIST 02 | | HrmInst_TransReportII.aspx | To Page |
| Non Circle Dicission Trnsfer | | HrmInst_TransReportNDLST.aspx | To Page |

තම ආයතනයේ සේවය කරන නිලධාරියාට අදාල ස්ථාන මාරු නියෝගය මෙමගින් ලබා ගත හැකි අතර, ස්ථාන මාරු ලබා දී ඇත්දැයි පරීක්ෂා කර බැලීම සඳහා Search ලෙස සඳහන්ව ඇති Text Box තුල ජාතික හැඳුනුම්පත් අංකය හෝ නමේ කොටසක් ඇතුලත් කර නිලධාරියා සොයා ගැනීම පහසුවෙන් කර ගත හැක.එහි ඇති වගුවෙහි පළමු තීරයේ සඳහන් Circle ID යන්න අතුරු මුහුනතේ (Interface) ඉහල ඇති By Circle ID හි ඇති Radio Button Tick කර එහි ඇති Text Box තුල Circle ID ලෙස දක්වා ඇති අංකය යෙදීමෙන් පසු Letter List ලෙස සඳහන්ව ඇති Button Click කිරීම තුලින් ස්ථාන මාරු නියෝගය ලබා ගත හැක.

මෙම ස්ථාන මාරු නියෝගය MISCO පද්ධතිය තුලින් ස්වයංක්‍රීයව උත්පාදනය (Auto Generate) වන බැවින් නැවත ඒ පිළිබඳව ඒකාබද්ධ සේවා අංශයේ ලිපි නිකුත් කරනු නොලැබේ.



COM/TRANS/AUG

COMBINED SERVICES DIVISION

2022.07.04

(Computer generated valid print)



Transfer REPORT-01 [2022]

By Circle ID

Letter List

Show 10 entries

Search:

| Circle ID | NIC | NAME | SERVICE | CLASS | NEW WORK PLACE | Remrks |
|---|---|---|---|---|---|---|
| 9460 | 908102800V | ජේ.ජී.ඩී.සී. චතුරාංගනී | කළමනාකරණ සේවා නිලධාරී සේවය | Class (III) | තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | |
| 9461 | 916852452v | එච්.එස්.සී. සේනාරත්න | කළමනාකරණ සේවා නිලධාරී සේවය | Class (III) | පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ස්ථාන මාරුව 2022/04/04 දින සිට ක්‍රියාත්මක වේ. |
| 9470 | 835031870V | එන්.එල්.සී. නිර්මලී | කළමනාකරණ සේවා නිලධාරී සේවය | Class (II) | මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | |
| 9470 | 716113272V | එස්.ඩී.එස්.පී. දිසානායක | කළමනාකරණ සේවා නිලධාරී සේවය | Class (I) | ගම්පහ උද්භිද උද්‍යානය | |
| 9506 | 695074212V | එම්.ඩී.ජේ. යටිවැල්ලේ | කළමනාකරණ සේවා නිලධාරී සේවය | Class (I) | මහනුවර ඇගයීම හා විභාග කාර්යාලය | |
| 9510 | 707050055V | එච්.ඩී.සී. පුෂ්පකුමාරි | කළමනාකරණ සේවා නිලධාරී සේවය | Class (I) | මහනුවර ඇගයීම හා විභාග කාර්යාලය | |
| 9520 | 697561684V | ජේ. ප්‍රියදර්ශනී | කළමනාකරණ සේවා නිලධාරී සේවය | Class (I) | කුරුණෑගල දිස්ත්‍රික් ඇගයීම හා විභාග කාර්යාලය | ස්ථාන මාරුව 2022/04/30 දින සිට ක්‍රියාත්මක වේ. |
| 9529 | 932280574V | ඩබ්.ජී.එච්. මධුසංඛ | කළමනාකරණ සේවා නිලධාරී සේවය | Class (III) | ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය | |
| 9643 | 923100210v | එම්.එම්.ඩී. ප්‍රසන් | කළමනාකරණ සේවා නිලධාරී සේවය | Class (III) | ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය | |

## 03. ස්ථාන මාරු නියෝග නිකුත් නොකල නිලධාරීන්ගේ ඉල්ලීම් සම්බන්ධව

ස්ථාන මාරු නියෝගයක් නිකුත් කිරීමේ හැකියාවක් නොමැති නම් ඒ සම්බන්ධ දැනුවත් කිරීම් Non Circle Decision Transfer හි To Page තුලට පිවිසීමෙන් බලා ගත හැක.



Combined Services Human Resources Management System

| | | |
|---|---|---|
| STEP01 -> GRAGUATES APPOINTMENT LIST - 2022 | HrmInst_ReqGraguateList_7.aspx | To Page |
| STEP02 -> DUTY ASSUME GRAGUATES APPOINTMENT LIST - 2022 | HrmInst_DutyAssumeN7.aspx | To Page |
| STEP03 -> ATTACHMENT (Graguaate Appointment / Transer officers) | HrmInst_Attachment.aspx | To Page |
| STEP04 ->ARRIVAL (for Attached persons at Sub Office) | HrmInst_Attachment02.aspx | To Page |
| INSTITUTE SUMMERY | HrmInst_GradgSummRpt01.aspx | To Page |
| PLACE AMENDMENT LIST (By special requirment) | HrmInst_ReqGRAmmendList_7.aspx | To Page |
| STEP01 (Transer) -> SPECIAL TRANSFER LIST 01 (With Transer Order) | HrmInst_TransReportI.aspx | To Page |
| STEP02 (Transer) ->RELESE FROM INSTITUTE (TRANSFER) | HrmInst_TrnsReleasment.aspx | To Page |
| STEP03 (Transer) -> DUTY ASSUME | HrmInst_DutyAssume.aspx | To Page |
| STEP04 (Transer) ->SPECIAL TRANSFER LIST 02 | HrmInst_TransReportII.aspx | To Page |
| Non Circle Dicission Trnsfer | HrmInst_TransReportNDLST.aspx | To Page |

APPOINTMENT - 2022

Development Officers Appointment - 2022 released. Please find follow the Links in Daily Updates Table.

_Combined Services Recruitment & IT Unit

2. Special Messages (Service)

3. Instructions,




## 04. ස්ථාන මාරු ලද නිලධාරීන් නිදහස් කිරීම හා වැඩ භාරගැනීම

ස්ථාන මාරු ලද නිලධාරීන් ආයතනයෙන් නිදහස් කිරීම සඳහා මුල් පිටුවෙහි ඇති STEP 02 (Transfer) ⟶ RELEASE FROM INSTITUTE (TRANSFER) ද, භාහිර ආයතනයකින් ස්ථාන මාරු ලැබ පැමිණෙන නිලධාරියෙකු හට ආයතනයේ වැඩ භාරගැනීම සඳහා STEP 03 (Transfer) ⟶ DUTY ASSUME ද භාවිත කලහැකි අතර අදාල කාර්යයන් සඳහා ඉදිරියෙන් දක්වා ඇති To Page ඔස්සේ අදාල අතුරු මුහුණත (Inter Face) වෙත යොමු විය හැක.

| DESCRIPTION | VALUE | PAGE | |
|---|---|---|---|
| STEP01 -> GRAGUATES APPOINTMENT LIST - 2022 | | HrmInst_ReqGraguateList_7.aspx | To Page |
| STEP02 -> DUTY ASSUME GRAGUATES APPOINTMENT LIST - 2022 | | HrmInst_DutyAssumeN7.aspx | To Page |
| STEP03 -> ATTACHMENT (Graguaate Appointment / Transer officers) | | HrmInst_Attachment.aspx | To Page |
| STEP04 ->ARRIVAL (for Attached persons at Sub Office) | | HrmInst_Attachment02.aspx | To Page |
| INSTITUTE SUMMERY | | HrmInst_GradgSummRpt01.aspx | To Page |
| PLACE AMENDMENT LIST (By special requiment) | | HrmInst_ReqGRAmmendList_7.aspx | To Page |
| STEP01 (Transer) -> SPECIAL TRANSFER LIST 01 (With Transer Order) | | HrmInst_TransReportI.aspx | To Page |
| STEP02 (Transer) ->RELESE FROM INSTITUTE (TRANSFER) | | HrmInst_TrnsReleasment.aspx | To Page |
| STEP03 (Transer) -> DUTY ASSUME | | HrmInst_DutyAssume.aspx | To Page |
| STEP04 (Transer) ->SPECIAL TRANSFER LIST 02 | | HrmInst_TransReportII.aspx | To Page |
| Non Circle Dicission Trnsfer | | HrmInst_TransReportNDLST.aspx | To Page |